# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන)

**(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා විසින් 2017 ජුනි මස 20 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2017 ජුනි මස 02 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[183 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 16.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 15.00 යි.**

2—PL 005260—510 (2017/06)

## නීතිය බලපෑමේ ප්‍රකාශනය

*2 වන වගන්තිය :* මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 12 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ–

(අ) වෙනත් නියම කිරීම් අතර නමක් සහ අංකයක් ලබාදීම මගින් එක් එක් කොට්ඨාසය සඳහා අනන්‍යතාවක් ලබා දීම ; සහ

(ආ) පනතේ සිංහල සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර අනුකූලතාවක් ඇතිකිරීම වේ.

*3 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ මැතිවරණයක දී එක් ස්වාධීන කණ්ඩායමකට වැඩි ගණනක් තරඟ කරනු ලබන අවස්ථාවක දී ස්වාධීන කණ්ඩායමක් සඳහා නිශ්චිත අංකයක් ලබා දීම වේ.

*4 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ–

(අ) පනතේ සිංහල හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර අනුකූලතාවක් ඇතිකිරීම ;

(ආ) නාමයෝජනා පත්‍රය පිටපත් දෙකකින් සකස් කිරීමේ අවශ්‍යතාවය ඉවත්කිරීම ; සහ

(ඇ) (i) තරුණ අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය සමස්ත ඡන්ද අපේක්ෂකයන්ගේ ප්‍රමාණයෙන් සියයට තිහක් දක්වා වැඩිකිරීම; සහ

(ii) නාමයෝජනා ඉදිරිපත් කිරීමට නියමිත තරුණ ඡන්ද අපේක්ෂකයන් ගණන ගැසට් නිවේදනයක පළකිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා වෙත විධිවිධාන සැලැස්වීම වේ.

*5 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ–

(අ) යම් පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් නාමයෝජනා කරනු ලැබූ එක් අපේක්ෂකයකු වෙනුවෙන් සහ යම් අමතර තැනැත්තකු සම්බන්ධයෙන් තැන්පත් කළ යුතු මුදල රුපියල් පන්දහසේ සිට රුපියල් දෙදහස් පන්සියය දක්වා අඩු කිරීම ;

(ආ) යම් ස්වාධීන කණ්ඩායමක් විසින් නාමයෝජනා කරනු ලැබූ එක් අපේක්ෂකයකු වෙනුවෙන් සහ යම් අමතර තැනැත්තකු සම්බන්ධයෙන් තැන්පත් කළ යුතු මුදල රුපියල් විසිපන්දහසේ සිට රුපියල් පන්දහස දක්වා අඩුකිරීම ; සහ

(ඇ) ස්වාධීන කණ්ඩායමක් මගින් නාමයෝජනා කරනු ලැබූ එක් අපේක්ෂකයකු වෙනුවෙන් සහ යම් අමතර තැනැත්තකු සම්බන්ධයෙන් තැන්පත් කළ යුතු මුදල රුපියල් විසිපන්දහසේ සිට පන්දහස දක්වා අඩුකිරීම.

*6 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ පනතේ සිංහල සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර අනුකූලතාවක් ඇතිකිරීමට කටයුතු සැලැස්වීම වේ.

*7 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ නාමයෝජනා කළ යුතු බවට පනත මගින් නියමකර ඇති මුළු තරුණ අපේක්ෂකයින් සංඛ්‍යාව අඩුවන අවස්ථාවක දී නාමයෝජනාපත්‍රය ප්‍රතික්ෂේප කිරීමට සැලැස්වීම වේ.

*8 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ තරග කිරීමකින් තොරව අපේක්ෂකයන් තේරීපත්වන බහු සභික කොට්ඨාසයක් සම්බන්ධයෙන් වන විට වෙනත් තැනැත්තකු නම් කිරීම සඳහා තේරීම්භාර නිලධාරී වෙත සහ යම් පිළිගත් දේශපාලන පක්ෂයක නායකයා වෙත හෝ ස්වාධීන කණ්ඩායම් නායකයා වෙත නිශ්චිත කාල සීමාවක් ලබා දීම වේ.

*9 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ අපේක්ෂකයකුගේ මරණය හේතු කොට ගෙන ඇති වූ පුරප්පාඩුවක් පිරවීම සඳහා නාමයෝජනා පත්‍රයේ දෙවන ස්ථානයේ සිටින තැනැත්තාට ලබා දී තිබූ බලය ඉවත් කිරීම වේ.

*10 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 39අ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ–

(අ) පනතේ සිංහල සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර අනුකූලතාවක් ඇති කිරීමට සැලැස්වීම; සහ

(ආ) වෙනත් නියම කිරීම් අතර "කොට්ඨාසයේ නම සහ අංකය" නිශ්චිතව සඳහන් කිරීම වේ.

*11 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ පනතේ සිංහල සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර අනුකූලතාවක් ඇති කිරීමට සැලැස්වීම වේ.

*12 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ පනතේ සිංහල සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර අනුකූලතාවක් ඇති කිරීමට සැලැස්වීම වේ.

*13 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ පනතේ සිංහල සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර අනුකූලතාවක් ඇති කිරීමට සැලැස්වීම වේ.

*14 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ මැතිවරණයේදී ස්වාධීන කණ්ඩායම් එකකට වඩා තරග කරන අවස්ථාවක දී නිශ්චිත අංකයක් ලබා දීම වේ.

*15 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ එම වගන්තියේ (අ) වන ඡේදය ඉවත් කිරීම සහ ඒ වෙනුවට නව ඡේදයක් ආදේශ කිරීමට සැලැස්වීම මගින් ඡන්ද පත්‍රිකාවක ඇතුළත් විය යුතු අවශ්‍යතා සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

*16 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 59අ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ–

(අ) තෝරා පත් කළ ගණන් කිරීමේ කාර්ය මණ්ඩලය ඔවුන් වෙත පවරන ලද කාර්යයන් ඉටු කිරීමට නුසුදුසු බව තේරීම්භාර නිලධරයාගේ මතය වන අවස්ථාවක දී වෙනත් ගණන් කිරීමේ කාර්ය මණ්ඩලයක් පත් කිරීමට තේරීම්භාර නිලධාරියාට හැකියාව ලබා දෙන විධිවිධාන සැලැස්වීම ; සහ

(ආ) තෝරාපත්කර ගණන් කිරීමේ නිලධරයා ඔහු වෙත පවරන ලද කාර්යයන් ඉටු කිරීමට නොහැකි බව තේරීම්භාර නිලධරයාගේ මතය වන අවස්ථාවක දී එම නිලධරයා වෙනුවට වෙනත් යම් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු හෝ ගණන් කිරීමේ නිලධරයකු පත් කිරීමට තේරීම්භාර නිලධරයාට හැකියාව ලබා දෙන විධිවිධාන සැලැස්වීම.

*17 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 59ආ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ–

(අ) ඡන්ද ගණන් කිරීම සඳහා වන ස්ථානය වෙනස් කරන ලද අවස්ථාවක දී නව ඡන්ද ගණන් කිරීමේ ස්ථානයක් නිශ්චය කිරීමට තේරීම්භාර නිලධරයා වෙත විධිවිධාන සැලැස්වීම;

(ආ) නව ඡන්ද ගණන් කිරීමේ ස්ථානය හා වේලාව තේරීම්භාර නිලධරයා සහ අනුයෝජිතයන්ට දැනුම් දීමට සහකාර තේරීම්භාර නිලධරයා වෙත විධිවිධාන සැලැස්වීම ; සහ

(ඇ) අලුත් ඡන්ද ගණන් කිරීමේ ස්ථානය පිළිබඳව තේරීම්භාර නිලධරයා වෙත දැන්වීමෙන් අනතුරුව අධීක්ෂණය කරනු ලබන සහකාර තේරීම්භාර නිලධරයා විසින් නිශ්චය කරනු ලබන ආකාරයට ඡන්දය ගණන් කිරීමේ කටයුතු සිදු කිරීමට ඡන්ද ස්ථානාධිපතිවරයා වෙත විධිවිධාන සැලැස්වීම.

*18 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ පනතේ සිංහල සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර අනුකූලතාවක් ඇති කිරීමට සැලැස්වීම වේ.

*19 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ පනතේ සිංහල සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර අනුකූලතාවක් ඇති කිරීම වේ.

*20 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ 64 වන වගන්තියේ වන නියමයට අමතරව 28 (ඇ) වන නියෝගය යටතේ වන ප්‍රකාශය නියම කිරීම වේ.

*21 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 65ආ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ පනතේ සිංහල සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර අනුකූලතාවක් ඇති කිරීම වේ.

*22 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 66අ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ පනතේ සිංහල සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර අනුකූලතාවක් ඇති කිරීම වේ.

*23 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 66ආ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ–

(අ) නගරාධිපතිවරයාගේ හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයාගේ ධුරය එම පළාත් පාලන ආයතනයේ නිල කාලසීමාව තුළ දී පුරප්පාඩු වන අවස්ථාවක දී තේරීම්භාර නිලධරයා වෙත එම කරුණු දැන්වීම සඳහා පළාත් පාලන කොමසාරිස්වරයා වෙත විධිවිධාන සැලැස්වීම;

(ආ) එවැනි පුරප්පාඩුවක් සම්බන්ධයෙන් එම නගරාධිපතිවරයා හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයා අයත්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයා විසින් දින 30ක් ඇතුළත තේරීම්භාර නිලධාරියාව දැනුවත් කළ යුතු අතර, නව නගරාධිපතිවරයා හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයාගේ නම තේරීම්භාර නිලධාරියා විසින් ප්‍රකාශයට පත්කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම;

(ඇ) නව නගරාධිපතිවරයා හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයා පත් කිරීම සඳහා තේරීම්භාර නිලධරයා වෙත විධිවිධාන සැලැස්වීම ;

(ඇ) මේ ආඥාපනතේ නිශ්චිතව සඳහන් කාර්ය පටිපාටිය ප්‍රකාරව පුරවන ලද නගරාධිපති ධුරයේ පුරප්පාඩුව, එම පුරප්පාඩුව පිරවීම සඳහා පත් කළ සාමාජිකයා තමා විසින්ම සිය ධුරයෙන් ඉල්ලා අස්වනු ලබන අවස්ථාවක දී දෙවන වරට මෙම ආඥාපනතේ නිශ්චිතව සඳහන් කාර්යය පටිපාටිය අනුව නොපිරවීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

*24 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 72අ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ "විවෘත" යන වචනය වෙනුවට "ආරම්භ" යන වචනය ආදේශ කිරීම වේ.

*25 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 81ආ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ ඉතා හදිසි සේවා ක්‍රියාත්මක කිරීම සඳහා හැර යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් වෙනුවෙන් ඡන්ද දායකයන්ට බලපෑම් කිරීමට පෙළඹවිය හැකි ආකාරයකට කරනු ලබන පත්වීමක් නොකළ යුතු බවට විධිවිධාන සැලැස්වීම වේ.

*26 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ "බලයලත් නියෝජිතයා", "රාජ්‍ය සංස්ථාව" සහ "රාජ්‍ය ආයතනය" යන යෙදුම් සඳහා නව අර්ථ නිරූපන ඇතුළත් කිරීම වේ.

*27 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය ඉවත් කරනු ලබන අතර, නව උපලේඛනයක් ආදේශ කරනු ලැබේ.

*28 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ -

(අ) ආවරණය කළ ලියුම් කවර ලැබීමෙන් පසු එම ආවරණය කළ ලියුම් කවර, ඡන්දය ආරම්භ කිරීමට පැය හැත්තෑ දෙකකට පෙර තැපැල් ඡන්ද දායකයන්ගේ ඡන්ද පෙට්ටිවල තැබීමට සැලැස්වීම ;

(ආ) ඡන්ද කොට්ඨාසවලට අනුව ආවරණය කළ ලියුම් කවර වෙන් කිරීම සඳහා තේරීම්භාර නිලධරයන් වෙත විධිවිධාන සැලැස්වීම ; සහ

(ඇ) ඡන්ද පත්‍රිකා ගණන් කිරීම ආරම්භ කිරීමට පෙරාතුව ඉක්මනින් තැපැල් ඡන්ද පත්‍රිකා ගණන් කිරීමට ක්‍රියා කිරීම සඳහා ගණන් කිරීමේ නිලධරයා වෙත විධාන ලබා දීම සඳහා තේරීම්භාර නිලධරයා වෙත විධිවිධාන සැලැස්වීම වේ.

# පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන)

එල්.ඩී.-ඕ. 35/2015

**(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2017 අංක  දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

262 වන අධිකාරයේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 12 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ අවසාන අතුරු විධානයේ (ii) වන ඡේදයේ,"නමකින් සහ අකාරාදිය අනුව වූ ඉංග්‍රීසි අක්ෂරයකින්" යන වචන වෙනුවට, "නමකින් සහ අංකයකින්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ -

(අ) "ඡන්ද දිස්ත්‍රික්ක" සහ "ඡන්ද දිස්ත්‍රික්කය" යන වචන යොදා ඇති සෑම ස්ථානයකම, ඒ වචන වෙනුවට පිළිවෙළින්, "ඡන්ද කොට්ඨාස" සහ "ඡන්ද කොට්ඨාසය" යන වචන ආදේශ කිරීමෙන්;සහ

(ආ) (ඇ) වන ඡේදයේ"දිස්ත්‍රික්කයට" යන වචනය වෙනුවට, "ඡන්ද කොට්ඨාසයට" යන වචන ආදේශ කිරීමෙන්.

(3) එම වගන්තියේ (2අ) වන උපවගන්තියේ, "එක් එක් ඡන්ද විමසීම් දිස්ත්‍රික්කයෙහි" යන වචන වෙනුවට, "එක් එක් ඡන්ද කොට්ඨාසයෙහි" යන වචන ආදේශ කිරීමෙන්; සහ

2—PL 005221 -510 (2017/05)

(4) එම වගන්තියේ (2ආ) වන උපවගන්තියේ, "ඡන්ද ප්‍රදේශයක් ඡන්ද දිස්ත්‍රික්ක සඳහා" යන වචන වෙනුවට "ඡන්ද ප්‍රදේශයක් ඡන්ද කොට්ඨාස සඳහා" යන වචන ආදේශ කිරීමෙන්.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියේ "පළාත් පාලන ප්‍රදේශ සම්බන්ධයෙන් අනුමත කරන ලද ලකුණු වෙන් කර දෙනු ලබන දිනය, වේලාව සහ ස්ථානය" යන වචන වෙනුවට,''අනුමත කරන ලද ලකුණු, වෙන් කර දෙනු ලබන දිනය, වේලාව ස්ථානය සහ එක් ස්වාධීන කණ්ඩායමකට වැඩි ගණනක් ඉදිරිපත් වී ඇති අවස්ථාවක දී හඳුනාගැනීමේ අංකයක්," යන වචන ආදේශ කිරීමෙන්,ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ, "මේ ආඥාපනත යටතේ" යන වචන වෙනුවට "මේ ආඥාපනතේ 8 වන වගන්තිය යටතේ" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (2ආ) වන උපවගන්තියේ, "නාමයෝජනා පත්‍රය පිටපත් දෙකකින් පිළියෙල කළ යුතු අතර එහි දෙවන පිටපත මත "පිටපත" යන්න පැහැදිලිව ලිවිය යුතු ය." යන වචන ඉවත් කිරීමෙන්.;

(3) එම වගන්තියේ (2ඇ) වන උපවගන්තියේ–

(අ) එම උපවගන්තිය, එහි (අ) වන ඡේදය ලෙස නැවත අංක කිරීමෙන්;

(ආ) එම නැවත අංක කරන ලද (අ) වන ඡේදයේ, "සියයට විසි පහක් කාන්තාවන් සහ තරුණයන්ගෙන් සමන්විත විය හැකි ය." යන වචන වෙනුවට "සියයට තිහකට අඩු නොවන සංඛ්‍යාවක් තරුණයන්ගෙන් සමන්විත විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) එම (අ) වන ඡේදයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(ආ) එක් එක් පළාත් පාලන ආයතනයක් වෙනුවෙන් නාමයෝජනා කරනු ලැබිය යුතු තරුණ අපේක්ෂකයන් සංඛ්‍යාව, කොමසාරිස්වරයා විසින් *ගැසට් පත්‍රයේ* පළ කරන දැන්වීමක් මගින් නියම කළ යුතු ය. නාමයෝජනා කළ යුතු මුළු තරුණ අපේක්ෂක සංඛ්‍යාවෙන් සියයට තිහ පූර්ණ සංඛ්‍යාවක් සහ භාගයක් වන්නා වූ සංඛ්‍යාවක් වන අවස්ථාවක, එම පූර්ණ සංඛ්‍යාව සහ භාගයට ආසන්නතම පූර්ණ සංඛ්‍යාව මේ උපවගන්තියේ කාර්ය සඳහා සියයට තිහ ලෙස සැලකිය යුතු ය.";

(4) එම වගන්තියේ (2ඉ) වන උපවගන්තියේ-

(අ) "(2ආ) උපවගන්තියේ සඳහන්" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "(2ඇ) වන උපවගන්තියේ සඳහන්"යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(ආ) "සියයට විසිපහ" යන වචන යොදා ඇති සෑම ස්ථානයක ම, "සියයට තිහ" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම උපවගන්තියේ, (අ) වන ඡේදයේ, "සහ කුමන හේතුවක් නිසා වුව ද, නාමයෝජනා කිරීමේ කාලසීමාවේ අවසන් දිනට ඉහතින් ම වූ දින මධ්‍යහන දොළහ පසු නොවී," යන වචන වෙනුවට, "(සහ කුමන හේතුවක් නිසා වුව ද, නාමයෝජනා කිරීමේ කාලසීමාවේ අවසන් දිනට ඉහතින් ම වූ දින මධ්‍යාහ්න දොළහ පසු නොවී)," යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම උපවගන්තියේ (අ) වන ඡේදයේ, (i) වන අනුඡේදයේ, "එක් අයකුට රුපියල් පන්දහසක මුදලක්;" යන වචන වෙනුවට, "එක් අයකුට රුපියල් දෙදහස් පන්සියයක මුදලක්;" යන වචන ආදේශ කිරීමෙන්;

(3) එම උපවගන්තියේ (අ) වන ඡේදයේ (ii) වන අනුඡේදයේ, "එක් අයකුට රුපියල් විසිදහසක මුදලක්," යන වචන වෙනුවට "එක් අයකුට රුපියල් පන්දහසක මුදලක්," යන වචන ආදේශ කිරීමෙන්; සහ

(4) එම උපවගන්තියේ (ආ) වන ඡේදයේ (ii) වන අනුඡේදයේ, "එකී ස්වාධීන කණ්ඩායමේ නායකයා," යන වචන වෙනුවට, "එකී ස්වාධීන කණ්ඩායමේ නායකයා හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා," යන වචන ආදේශ කිරීමෙන්.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තියේ (4) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම උපවගන්තියේ, "ඡන්ද කොට්ඨාසයේ" යන වචන වෙනුවට, "කොට්ඨාසයේ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එම උපවගන්තියේ අතුරු විධානයේ, "එම ඡන්ද කොට්ඨාසයේ" යන වචන වෙනුවට, "ඡන්ද විමසීම් ප්‍රදේශයේ" යන වචන ආදේශ කිරීමෙන්.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (ආ) වන ඡේදයට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ආආ) 28 වන වගන්තියේ (2ඇ) වන උපවගන්තියේ (අ) වන ඡේදය යටතේ නාමයෝජනා කිරීමට නියමිත තරුණ අපේක්ෂකයන් මුළු සංඛ්‍යාව ඇතුළත් කරනු නොලැබූ යම් නාමයෝජනා පත්‍රයක්; හෝ".

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ අවසානයට පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්,මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඇ) තරග කිරීමකින් තොරව අපේක්ෂකයන් තේරීපත්වන බහු සභික කොට්ඨාසයක් හෝ කොට්ඨාසවලින් සමන්විත පළාත් පාලන ආයතනයක් සම්බන්ධයෙන් නාමයෝජනා භාරදීමේ අවසාන සතියෙන් පසුව සති එකක කාලයක් ඇතුළත, තේරීම්භාර නිලධරයා විසින් පිළිවෙළින් එම කොට්ඨාසය හෝ කොට්ඨාස සඳහා මේ ආඥාපනතේ 8 වන වගන්තිය යටතේ සුදුසුකම්

ලැබූ තවත් තැනැත්තකු හෝ තැනැත්තන් ඉල්ලීමේ දින සිට සති තුනක කාලයක් ඇතුළත නම් කරන ලෙස, පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයාගෙන් හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයාගෙන් ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ, "හෝ එම පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම භාරදෙනු ලැබූ නාමයෝජනා පත්‍රයේ දෙවන ස්ථානයේ නම සඳහන් තැනැත්තා විසින්" යන වචන ඉවත් කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 39අ වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 39අ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ, "එම ප්‍රදේශයේ යම් කොට්ඨාසයක ඡන්ද හිමි නාමලේඛනයේ" යන වචන වෙනුවට, "එම ඡන්ද විමසීම් ප්‍රදේශයේ යම් කොට්ඨාසයක ඡන්දහිමි නාමලේඛනයේ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) වන ඡේදය ඉවත්කර, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ඇ) කොට්ඨාසයේ නම සහ අංකය ;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (අ) වන ඡේදයේ, ''ඡන්ද දිස්ත්‍රික්කයක'' යන වචන වෙනුවට ''ඡන්ද කොට්ඨාසයක" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තියේ, ''ඡන්ද කොට්ඨාසයක්'' සහ ''ඡන්ද කොට්ඨාසය'' යන වචන යොදා ඇති සෑම ස්ථානයක ම ඒ වචන වෙනුවට පිළිවෙළින්, ''කොට්ඨාසයක්" සහ "කොට්ඨාසය" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය, එහි (ඇ) වන ඡේදයේ, "ඒ ඡන්ද කොට්ඨාසයේ" යන වචන වෙනුවට, "ඒ කොට්ඨාසයේ" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ "අපේක්ෂකයන්ගේ නම් සිංහල අකාරාදී අනුපිළිවෙළට ද, ඒ එක් එක් පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමට වෙන් කර දී ඇති අනුමත කරන ලද ලකුණ ද" යන වචන වෙනුවට, "අපේක්ෂකයන්ගේ නම් ද එක් එක් පක්ෂයකට හෝ කණ්ඩායමකට වෙන්කර දී ඇති අනුමත කරන ලද ලකුණ ද ස්වාධීන කණ්ඩායම් එකකට වඩා වැඩි ප්‍රමාණයක් සිටින අවස්ථාවක දී නාම යෝජනා පත්‍රයේ සඳහන් පරිදි එක් එක් කණ්ඩායමකට වෙන්කර දී ඇති හඳුනා ගැනීමේ අංක ද" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය සංශෝධනය කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 47වන වගන්තියේ (අ) වන ඡේදය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(අ) ඡන්ද විමසීමට තරග කරන පිළිගත් දේශපාලන පක්ෂවල නම්, සිංහල අකාරාදී අනුපිළිවෙළට සකස් කොට, ඒ ඒ පක්ෂයේ නමට කෙළින්, ඒ ඒ පක්ෂයට වෙන්කර දී ඇති ලකුණ සමග සිංහලෙන්, දෙමළෙන් හා ඉංග්‍රීසියෙන් ඇතුළත් විය යුතු අතර, ඊට ඉක්බිතිව ම, ඡන්ද විමසීම සඳහා තරග කරන "ස්වාධීන කණ්ඩායම්" ඇතහොත් ඒ එක් එක් කණ්ඩායම සඳහා "ස්වාධීන කණ්ඩායම" යන වචන නැවත සඳහන් කොට, අනුක්‍රමික අංක අනුපිළිවෙළ අනුව ඒ එක් එක් කණ්ඩායම සඳහා වූ හඳුනාගැනීමේ අංකයද ඊට කෙලින් යොදන ලද ඒ එක් එක් කණ්ඩායමට වෙන් කර දී ඇති ලකුණ ද එහි ඇතුළත් විය යුතු අතර, එම ලකුණ ඉදිරියෙන් ඡන්දය සලකුණු කිරීම සඳහා හිස් කොටුවක් ද ඇතුළත් කර තිබිය යුතු ය. ඡන්ද දායකයකු විසින් එම ලබා දී ඇති කොටුව තුළ ඡන්දය සලකුණු කළ යුතු ය.".

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 59අ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 59අ වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (2) වන උපවගන්තියේ, "කාර්ය මණ්ඩලය ගණන් කිරීමේ කාර්ය මණ්ඩලය වශයෙන් කටයුතු කළ යුතු ය." යන වචන වෙනුවට, "කාර්ය මණ්ඩලය ගණන් කිරීමේ කාර්ය මණ්ඩලය වශයෙන් කටයුතු කළ යුතු ය. කෙසේ වුවත්, එම ගණන් කිරීමේ කාර්ය මණ්ඩලයට

හෝ එම කාර්ය මණ්ඩලයේ සිටින නිලධරයකුට එම ඡන්ද පොළේ කටයුතු කරගෙන යාමට නොහැකි බව හෝ එම කටයුතු කිරීමට නුසුදුසු බව හෝ තේරීම්භාර නිලධරයාට හැඟීයන්නේ නම්, එම ගණන් කිරීමේ කාර්ය මණ්ඩලය වෙනුවට වෙනත් ගණන් කිරීමේ කාර්ය මණ්ඩලයක් හෝ එම කාර්ය මණ්ඩලයේ සිටින නිලධරයකු වෙනුවට වෙනත් නිලධරයකු හෝ තේරීම්භාර නිලධරයා විසින් පත් කරනු ලැබිය හැකි ය." යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එම වගන්තියේ (4) වන උපවගන්තියේ,"මැතිවරණ කොමසාරිස්වරයා විසින්" යන වචනවල පටන්, එම උපවගන්තියේ අවසානය දක්වා වූ සියලු වචන ඉවත් කිරීමෙන් හා ඒ වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"හෝ යම් ඡන්ද පොළකට පත්කර ඇති ගණන් කිරීමේ නිලධරයාට එම ගණන් කිරීමේ කටයුතු සිදුකරගෙන යාමට නොහැකි බව හෝ එම නිලධරයා ගණන් කිරීමේ නිලධරයා වශයෙන් කටයුතු කිරීමට නුසුදුසු බව තේරීම්භාර නිලධරයාට හැඟීයන්නේ නම්, අවස්ථාවෝචිත පරිදි පළමුව සඳහන් කළ නිලධරයා වෙනුවට ගණන් කිරීමේ නිලධරයකු ලෙස කටයුතු කිරීම සඳහා වෙනත් යම් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු හෝ සහකාර තේරීම්භාර නිලධරයකු, තේරීම්භාර නිලධරයා විසින් පත්කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 59ආ වන වගන්තිය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 59ආ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ, "ඡන්දය දීම අධීක්ෂණය කරනු ලබන තේරීම්භාර නිලධාරියා විසින් පත්කරනු ලබන සහකාර තේරීම්භාර නිලධරයා වෙත එම කරුණ දැන්විය යුතු අතර, ඉන්පසුව එම සහකාර තේරීම්භාර නිලධරයා" යන වචන වෙනුවට "ඡන්දය දීම අධීක්ෂණය කරනු ලබන සහකාර තේරීම්භාර නිලධරයා විසින් තේරීම්භාර නිලධරයා වෙත එම කරුණ දැන්විය යුතු අතර, ඉන්පසුව එම තේරීම්භාර නිලධරයා විසින්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ, "එම සහකාර තේරීම්භාර නිලධරයා විසින්" යන වචන වෙනුවට, "එම සහකාර තේරීම්භාර නිලධාරයා විසින් තේරීම්භාර නිලධරයා වෙත ද සහ ඉන්පසුව" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එම වගන්තියේ (3) වන උපවගන්තියේ, "අලුත් ස්ථානයෙහි ඡන්ද ගණන් කිරීම ඡන්ද පොළෙහි ඡන්ද ස්ථානාධිපතිවරයා විසින්" යන වචන වෙනුවට, "අලුත් ස්ථානය පිළිබඳව තේරීම්භාර නිලධරයා වෙත දැන්වීමෙන් අනතුරුව අධීක්ෂණය කරනු ලබන සහකාර තේරීම්භාර නිලධරයා විසින් නිශ්චය කරනු ලබන ආකාරයට අලුත් ස්ථානයෙහි ඡන්ද ගණන් කිරීම ඡන්ද පොළෙහි ඡන්ද ස්ථානාධිපතිවරයා විසින්" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය සංශෝධනය කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය, එහි (3) වන උපවගන්තියේ, "ඡන්ද කොට්ඨාසයේ" යන වචන වෙනුවට "කොට්ඨාසයේ" යන වචනය ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය සංශෝධනය කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ, "ඡන්ද කොට්ඨාසය" යන වචන වෙනුවට "කොට්ඨාසය" යන වචනය ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය සංශෝධනය කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ, "64 වන වගන්තියේ සඳහන් ලේඛන" යන වචන සහ ඉලක්කම වෙනුවට, "64 වන වගන්තියේ සඳහන් ලේඛන සහ නවවන උපලේඛනයේ 28(ඇ) වන නියෝගය යටතේ වූ ප්‍රකාශය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්,මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 65ආ වන වගන්තිය සංශෝධනය කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 65ආ වන වගන්තිය, එහි (8) වන උපවගන්තියේ, "සම ලේකම්වරයා හෝ නායකයාගෙන්" යන වචන වෙනුවට, "එම ලේකම්වරයාගෙන් හෝ නායකයාගෙන්" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 66අ වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ "(252 වන අධිකාරය වූ) මහනගර සභා ආඥාපනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ හෝ (252 වන අධිකාරය වූ) නගරසභා ආඥාපනතේ" යන වචන වෙනුවට "(252 වන අධිකාරය වූ) මහනගර සභා ආඥාපනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ හෝ (255 වන අධිකාරය වූ) නගර සභා ආඥාපනතේ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 66අ වන වගන්තිය සංශෝධනය කිරීම.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 66ආ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 66ආ වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (2) වන උපවගන්තියේ -

(අ) "පළාත් පාලන ආයතනයේ නිල කාලසීමාව ඇතුළත පුරප්පාඩු වන අවස්ථාවක දී, කොමසාරිස්වරයා විසින්" යන වචන වෙනුවට, "පළාත් පාලන ආයතනයේ නිල කාලසීමාව ඇතුළත පුරප්පාඩු වන අවස්ථාවක දී ඒ පුරප්පාඩුව ඇති වූ බව පළාත් පාලන කොමසාරිස්වරයා විසින් තේරීම්භාර නිලධරයා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතු අතර, තේරීම්භාර නිලධරයා විසින්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) "දින තිහක් ඇතුළත දී කොමසාරිස්වරයාට දැනුම් දෙන ලෙස ඉල්ලා සිටිය යුතු ය. එම තීරණය ලැබීමෙන් පසුව, එම පළාත් පාලන ආයතනයේ අවස්ථාවෝචිත පරිදි නගරාධිපතිවරයා හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයා වශයෙන් සඳහන් කර ඇති සභිකයාගේ නම කොමසාරිස්වරයා විසින්" යන වචන වෙනුවට, "දින තිහක් ඇතුළත දී තේරීම්භාර නිලධරයාට දැනුම් දෙන ලෙස ඉල්ලා සිටිය යුතු ය. එම තීරණය ලැබීමෙන් පසුව, එම පළාත් පාලන ආයතනයේ, අවස්ථාවෝචිත පරිදි, නගරාධිපතිවරයා හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයා වශයෙන් සඳහන් කර ඇති සභිකයාගේ නම තේරීම්භාර නිලධරයා විසින් ප්‍රකාශයට පත්කරනු ලැබිය යුතු ය."

(2) එම වගන්තියේ (3) වන උපවගන්තියේ, "කොමසාරිස්වරයා විසින් අවස්ථාවෝචිත පරිදි" යන වචන වෙනුවට, "තේරීම්භාර නිලධරයා විසින් අවස්ථාවෝචිත පරිදි" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එම වගන්තියේ (4) වන උපවගන්තියේ, "එම උපවගන්තියෙහි නිශ්චිතව දක්වා ඇති කාර්ය පටිපාටිය ප්‍රකාරව එම පුරප්පාඩුව පුරවනු ලැබ ඇති අවස්ථාවක දී සහ ඉහත කී වගන්ති යටතේ එකී යම් පුරප්පාඩුවක් පිරවීම සඳහා එසේ පත්කර ගනු ලැබූ යම් නගරාධිපතිවරයකු සිය ධුරයෙන් ඉල්ලා අස් වූ ලෙස සලකනු ලබන විටෙක එසේ ඇතිවන පුරප්පාඩුවක් මෙම වගන්තියේ (2) වන උපවගන්තියෙහි නිශ්චිතව සඳහන් කාර්ය පටිපාටිය අනුව පුරවනු නොලැබිය යුතු ය." යන වචන වෙනුවට, "මෙම ආඥාපනතේ නිශ්චිතව දක්වා ඇති කාර්ය පටිපාටිය ප්‍රකාරව, නගරාධිපති ධුරයේ ඇති වූ එකී පුරප්පාඩුව පුරවනු ලැබ ඇති අවස්ථාවක දී සහ එලෙස ඇති වූ පුරප්පාඩුවක් පිරවීම සඳහා පත්කර ගනු ලැබූ යම් සභිකයකු ඔහු විසින් ම සිය ධුරයෙන් ඉල්ලා අස් වූ අවස්ථාවක දී එසේ ඊට පසුව ඇතිවන පුරප්පාඩුව මෙම ආඥාපනතේ නිශ්චිතව සඳහන් කාර්ය පටිපාටිය අනුව පුරවනු නොලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්.".

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 72අ වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ, "විවෘත" යන වචනය වෙනුවට "ආරම්භ" යන වචනය ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 72අ වන වගන්තිය සංශෝධනය කිරීම.

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ, 81ආ වන වගන්තිය, එහි (1අ) වන උපවගන්තියේ, (අ) වන ඡේදය ඉවත් කරනු ලැබීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කරනු ලැබීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 81ආ වන වගන්තිය සංශෝධනය කිරීම.

"(අ) (i) යම් රාජ්‍ය ආයතනයකට කරනු ලබන කිසිදු පත්කිරීමක් යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමක් වෙනුවෙන් මනාපය ප්‍රකාශ කිරීමට ඡන්ද දායකයන්ට බලපෑම් කිරීමට පෙළඹවීමක් තිබිය හැකිවන්නා වූ ලෙසින් සිදු නොකළ යුතු ය. කෙසේ වුව ද,

(ii) ඉහත (i) වන අනුඡේදයේ කුමක් සඳහන්ව ඇතද එවැනි ආයතනයකට කරනු ලබන යම් පත්වීමක් ඉතා හදිසි සහ ඒවා කල්දැමීමෙන් මහජනතාවගේ සාමාන්‍ය ජන ජීවිතය බිඳවැටීමක් හෝ උග්‍ර සෞඛ්‍ය උපද්‍රවයකට හෝ මහජනතාවට හානියක් සිදුවීමට හේතුවිය හැකි වන්නාවූ යම් අත්‍යවශ්‍ය සේවාවක් කරගෙන යාමේ කාර්යයක් වෙනුවෙන් සිදුකළ හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තිය සංශෝධනය කිරීම.

**26.** 2012 අංක 22 දරන පනතින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තිය පහත දැක්වෙන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ "අනුමත ලකුණ" යන්නෙහි අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන්:-

' "බලයලත් නියෝජිතයා" යන්න අවස්ථාවෝචිත පරිදි පිළිගත් දේශපාලන පක්ෂයක් සම්බන්ධයෙන් හෝ ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් යෙදී ඇති විට, ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ බලයලත් නියෝජිතයා වීමට ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් හෝ ඒ ස්වාධීන කණ්ඩායමේ නායකයා විසින් යම් තැනැත්තකුට ප්‍රකාශිතව ලියවිල්ලකින් බලය දී ඇත්තේ ද, සහ එසේ බලය දෙන ලද බව නාමයෝජනා කිරීමේ කාලසීමාව ආරම්භ වීමට යටත් පිරිසෙයින් පැය හැත්තෑදෙකට පෙර එම ලේකම් හෝ එම කණ්ඩායමේ නායකයා විසින් ඡන්ද විමසීම පැවැත්වෙන ඡන්ද ප්‍රදේශයේ තේරීම්භාර නිලධරයා වෙත දැනුම් දී ඇත්තේ ද, එවැනි තැනැත්තෙක් අදහස් වේ;".

(2) එම වගන්තියේ "තත්කාලයේ බලපවත්නා පාර්ලිමේන්තු ලේඛනය" යන යෙදුමේ අර්ථනිරූපනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපන ඇතුළත් කිරීමෙන්:-

' "රාජ්‍ය සංස්ථාව" යන්නෙන්, 2007 අංක 7 දරන සමාගම් ආඥාපනත යටතේ හැර වෙනත් යම්කිසි ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ

පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද, ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ;

"රාජ්‍ය ආයතනය" යන්නට, අමාත්‍යාංශයක්, රජයේ දෙපාර්තමේන්තුවක්, රාජ්‍ය සංස්ථාවක්, පළාත් සභාවක් මගින් හෝ පළාත් සභාවක ප්‍රඥප්තියක් මගින් පිහිටවනු ලැබූ යම් ආයතනයක්, පළාත් පාලන ආයතනයක්, රජයට පවරා ගත් යම් වෙළෙඳ ව්‍යාපාරයක් හෝ රජයට පවරාගත් වෙනත් ව්‍යාපාරයක් සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ හෝ ලියාපදිංචි කරනු ලැබූ ලෙස සලකනු ලබන්නා වූ ද, රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් සියයට පනහකට වැඩි කොටස් දරන්නා වූ ද යම් සමාගමක් ද ඇතුළත් වේ;".

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ පළමු වන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.

"**පළමුවන උපලේඛනය** [28 (2) වන වගන්තිය]

නාම යෝජනා ආකෘති පත්‍රය

........................................................................................................ මහ නගර සභාව/ නගර සභාව/ ප්‍රාදේශීය සභාව.

පිළිගත් දේශපාලන පක්ෂයක් වන ............ ......................................................... පක්ෂය විසින්/ (ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් වන විට ස්වාධීන කණ්ඩායමේ නායකයා වන ..........................................................) විසින් ........................................................... මහ නගර සභාවේ/ නගර සභාවේ/ ප්‍රාදේශීය සභාවේ සභිකයින් තෝරා ගැනීම සඳහා අපේක්ෂකයින් වශයෙන් පහත දැක්වෙන තැනැත්තන් මෙයින් නාම යෝජනා කරනු ලැබේ-

**I - අපේක්ෂකයන්**

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
|---|---|---|---|---|---|---|
| නම සහ කොට්ඨාසයේ අංකය "*" | නම - පිරිමි/ කාන්තා ජාතික (හැඳුනුම්පතේ හෝ උප්පැන්න සහතිකයේ සඳහන් පරිදි) | ජාතික හැඳුනුම්පත් අංකය | පදිංචි ලිපිනය | රැකියාව | තරුණ අපේක්ෂකයකු වන හෝ නොවන බව (Y) | අපේක්ෂකයාගේ කැමැත්ත පෙන්නුම් කිරීම සඳහා තබන අත්සන |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

**II - අමකර තැනැත්තන්**

| 1 | 2 | 3 | 4 | 5 | 6 |
|---|---|---|---|---|---|
| පිරිමි/කාන්තා නම (ජාතික හැඳුනුම්පතේ හෝ උප්පැන්න සහතිකයේ සඳහන් පරිදි) | ජාතික හැඳුනුම්පත් අංකය | පදිංචි ලිපිනය | රැකියාව | තරුණ අපේක්ෂකයකු වන හෝ නොවන බව (Y) | අමතර තැනැත්තනගේ කැමැත්ත පෙන්නුම් කිරීම සඳහා තබන අත්සන |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

මෙම නාමයෝජනා පත්‍රයෙහි නම් සඳහන් සියලු තරුණ අපේක්ෂකයන් ආඥාපනතේ 89 වන වගන්තියෙහි නිශ්චිතව දක්වා ඇති වයස් සීමාව තුළ සිටින බවට මම මෙයින් සහතික කරමි.

පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ගේ/ ස්වාධීන කණ්ඩායම් නායකයාගේ -

අත්සන ;..............................................................
නම ;..............................................................
ලිපිනය ;..............................................................
නිල මුද්‍රාව ;.......................................................

ඉහත නම සඳහන් .............................................................. යන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්/ ස්වාධීන කණ්ඩායම් නායක විසින් 20............. මස ..................... දින මා ඉදිරිපිට දී අත්සන් කරන ලදී.

...........................................................

(සාම විනිසුරු/දිවුරුම් කොමසාරිස්)
නිල මුද්‍රාව

ලිපිනය .......................................................

*කොට්ඨාසය බහු සභික කොට්ඨාසයක් ද යන බව, සභිකයින් දෙදෙනකු තෝරා පත්කර ගැනීමේ දී තරු සලකුණු එකකින් ද (*) සභිකයින් තිදෙනකු තෝරා පත්කර ගැනීමේ දී තරු සලකුණු දෙකකින් ද (**) ආදී වශයෙන් පෙන්නුම් කිරීමෙන් සඳහන් කරන්න".

[28 (2අ) වන වගන්තිය]

**කාන්තා අපේක්ෂිකාවන් තෝරා යැවීම සඳහා වන නාම යෝජනා ආකෘති පත්‍රය**

තේරීම්භාර නිලධාරි,
................................. සභාව,

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම**

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 28(2අ) වන වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන නම් ලැයිස්තුව.

......................................... මහ නගර සභාව/ නගර සභාව/ ප්‍රාදේශීය සභාව.

................................ වන මම ...........................සභාව සඳහා තරග කරන පහත පිළිගත් දේශපාලන පක්ෂයක් වන ......................................... පක්ෂයේ ලේකම්/ ස්වාධීන කණ්ඩායමේ නායක වශයෙන්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 28(2අ) වන වගන්තිය යටතේ, ප්‍රමුඛතා අනුපිළිවෙළට සකස් කරන ලද කාන්තා අපේක්ෂිකාවන්ගේ නම් ලැයිස්තුව මේ සමග ඉදිරිපත් කරමි.

| අනු අංකය | නම (ජාතික හැඳුනුම්පතේ හෝ උප්පැන්න සහතිකයේ සඳහන් පරිදි) | ජාතික හැඳුනුම්පත් අංකය | | | | | | | | | | | | පදිංචි ලිපිනය | රැකියාව | කාන්තා අපේක්ෂිකාවගේ කැමැත්ත පෙන්නුම් කිරීම සඳහා තබන අත්සන |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | | | | | | | | | | | | | | | | |
| 02 | | | | | | | | | | | | | | | | |
| 03 | | | | | | | | | | | | | | | | |
| 04 | | | | | | | | | | | | | | | | |
| 05 | | | | | | | | | | | | | | | | |
| 06 | | | | | | | | | | | | | | | | |
| 07 | | | | | | | | | | | | | | | | |
| 08 | | | | | | | | | | | | | | | | |
| 09 | | | | | | | | | | | | | | | | |
| 10 | | | | | | | | | | | | | | | | |
| 11 | | | | | | | | | | | | | | | | |
| 12 | | | | | | | | | | | | | | | | |
| 13 | | | | | | | | | | | | | | | | |
| 14 | | | | | | | | | | | | | | | | |
| 15 | | | | | | | | | | | | | | | | |

පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ගේ/ ස්වාධීන කණ්ඩායම් නායකයාගේ -

අත්සන :............................................................
නම :............................................................
ලිපිනය :............................................................
නිල මුද්‍රාව :............................................................
දිනය :............................................................ .".

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන උපලේඛනය සංශෝධනය කිරීම.

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ නමවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම උපලේඛනයේ 17 වන නියෝගයේ, "ඡන්ද විමසීම අවසන් වීමට පෙර" යන වචන වෙනුවට, "ඡන්ද විමසීම ආරම්භවීමට පැය හැත්තෑ දෙකකට පෙර" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම උපලේඛනයේ 18 වන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

''තැපැල් ඡන්ද පත්‍රිකා අඩංගු ආවරණ ලියුම් කවර කොට්ඨාස අනුව වර්ග කිරීම.

18. තේරීම්භාර නිලධාරියා විසින් විවෘත නොකරන ලද ආවරණ ලියුම් කවර තැපැල් ඡන්ද දායකයන්ගේ ඡන්ද පෙට්ටි තුළට බහාලීමෙන් පසුව සහ ඡන්ද විමසීම ආරම්භවීමට පෙර ඕනෑම වේලාවක,තැපැල් ඡන්ද දායකයන්ගේ ඡන්ද පෙට්ටි විවෘත කර ඒවායේ ඇති ආවරණ ලියුම් කවර එක් එක් කොට්ඨාස අනුව වෙන් කළ යුතු ය. ආවරණ ලියුම් කවර වෙන් කිරීම නිම වූ විට, තේරීම්භාර නිලධරයා විසින් එම එක් එක් කොට්ඨාසයට අදාළ ආවරණ ලියුම් කවර, ඒ ඒ කොට්ඨාසය සඳහා වෙන වෙනම කවරයක බහා මුද්‍රාව තබා ඡන්ද පත්‍රිකා සහ වෙනත් බඩු බාහිරාදිය සමග ඡන්ද විමසීමේ දිනයට පෙර දින අදාළ කොට්ඨාසය සඳහා පත් කරනු ලැබූ ගණන් කිරීමේ නිලධරයා වෙත භාර දිය යුතු ය.";

(3) එම උපලේඛනයේ 19 වන නියෝගය වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

"තැපැල් ඡන්ද පත්‍රිකා ගණන් කිරීම.

19. තේරීම්භාර නිලධරයා විසින්, ඡන්ද පත්‍රිකා ගණන් කිරීම ආරම්භ කිරීමට පෙරාතුව ම, ඉක්මණින් කොට්ඨාසය සඳහා පත් කර ඇති ඡන්ද ගණන් කිරීමේ නිලධරයා මගින් කොට්ඨාසයට අදාළ තැපැල්

ඡන්ද පත්‍රිකා අඩංගු ආවරණ ලියුම් කවර විවෘත කරවා ඡන්දය ගණන් කිරීම ඉදිරියට කරගෙන යා යුතු ය.";

(4) එම උපලේඛනයේ 20 වන, 21 වන, 22 වන, 23 වන නියෝග සහ 24 වන නියෝගයේ (1) වන ඡේදය ඉවත් කිරීමෙන්;

(5) එම උපලේඛනයේ 28 වන නියෝගයේ (ඇ) වන ඡේදය වෙනුවට පහත ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ඇ) එක් එක් අපේක්ෂකයන්ට දෙන ලද ඡන්ද සංඛ්‍යාව පිළිබඳ ලිඛිත ප්‍රකාශය; ";

(6) එම උපලේඛනයේ "අ" වන ආකෘතියේ -

(අ) "ඡන්ද ප්‍රදේශය, ඡන්ද කොට්ඨාසය" යන වචන වෙනුවට, "ඡන්ද කොට්ඨාසය, කොට්ඨාසයේ නම සහ අංකය:" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) "ඡන්ද ප්‍රදේශයේ අක්ෂරයඃ" යන වචන වෙනුවට "ඡන්ද කොට්ඨාසයේ අංකයඃ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) "ඡන්ද කොට්ඨාසයේ අංකයඃ" යන වචන වෙනුවට "කොට්ඨාසයේ නම සහ අංකය ඃ" යන වචන ආදේශ කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**29.** මේ පනතේ, සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.